# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2026.01.29 මාධ්‍ය නිවේදන අංක 2026/009

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**ලංකා සතොස ආයතනයේ හිටපු ජ්‍යෙෂ්ඨ කළමණාකරුවෙකු සහ තවත් පුද්ගලයන් දෙදෙනෙකු දූෂණ චෝදනා මත අත්අඩංගුවට**

අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ ලංකා සතොස ආයතනයේ පවත්නා නීතිරීතිවලට පටහැනිව ලංකා සතොස ආයතනයට පාඩුවක් වන බවට දැනුම හා චේතනාව ඇතිව පුද්ගලික ව්‍යාපාරිකයෙකුට වාසියක් සැලසීමේ අරමුණින් සුදුළූණු කිලෝ ග්‍රෑම් 54860 ක් කිලෝ එකක් රු.135 /- ක මුදලකට පුද්ගලික පාර්ශ්වයකට විකිණීමෙන් රු.17,006,600/- ක පාඩුවක් ලංකා සතොස ආයතනය වෙත සිදු කිරීමේ දූෂණ චෝදනා මත ලංකා සතොස ආයතනයේ හිටපු ජ්‍යෙෂ්ඨ කළමණාකරුවෙකු (සැපයුම්) වූ රණසිංහගේ සිරිනිමල් ප්‍රනාන්දු සහ පෞද්ගලික තැරැව්කරුවෙකු වන දොමගමුව මුදියන්සේලාගේ ආරියවංශ සහ ව්‍යාපාරිකයෙකු වන සින්නයියා කමල කුමාර් යන අයවලුන් 2026.01.29 වන දින පිළිවෙළින් පෙ.ව.9.15ට , පෙ.ව.9.17ට සහ පෙ.ව.11.20ට පමණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය
0112502672